**මඩුල්ල ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**--------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 01 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අගෝස්තු 07 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 අගෝස්තු 27 වැනි දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට මඩුල්ල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 ***ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.***

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබී තිබූ රු.18,851 ක අන්තර් ගම්මාන නඩත්තු ගිණුමේ පොළිය හා අන්තර් ගම්මානවලින් ලද මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමෙන් ලද රු.525,758 ක පොළිය ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සභාව සතු ඔබ්බේගොඩ පුස්තකාල ගොඩනැගිල්ලේ වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරිමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු කර්මාන්ත ආධාර රු.1,038,402 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) සභාව සතු පුස්තකාල සඳහා ඉකුත් වර්ෂවලදී පරිත්‍යාග වශයෙන් ලැබුණු පුස්තකාල පොත් 385 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු රු.187,141 ක් විවිධ ණයහිමියන් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

(ඊ) පසුගිය වර්ෂ 07 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.128,811 ක විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලස්වා නොතිබුණි.

1.3.3 **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

ගිණුම් විෂයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.36,715,260 ක් වූ අතර උපයෝගී පොත්වලට අනුව ශේෂය රු.34,903,933 ක් විය.

1.3.4 **<u>ලැබිය යුතු ගිණුම්</u>**

සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 06 දෙනෙකුගෙන් සේවක ණය රු.36,904 ක් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

1.3.5 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 23,663,140 ක් වූ වත්කම් විෂයන් 03 ක් හා රු.19,956,560 ක් වූ වගකීම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

13.6 **<u>නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.</u>**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| <u>නීති,රීති රෙගුලාසි වලට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) **<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u>** | |
| (i) 49 හා 52 වගන්තිය | අනුමැතියකින් තොරව ගොඩනැගිලි සීමාව තුල ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 04 ක් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ii) 136 වගන්තිය | සභාව සතු කඩ කාමර සඳහා කුලී, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) 152 වගන්තිය | සභා බල ප්‍රදේශයේ ඉදිකර තිබූ සම්ප්‍රේෂණ කුළුණු වෙනුවෙන් වාර්ෂික බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) 158 හා 159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.25,173,986 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

(ආ) <u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| 237 (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී අවස්ථා 7 කදී රු.140,530 ක මිලදී ගැනීම් වෙනුවෙන් තොග සහතික ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ජනරජයේ අංක 1597/8 හා 2009 අප්‍රේල් 12 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ V වැනි ඇමුණුමෙහි 6 ඡේදය. | අනුමැතියකින් තොරව ඉදිකර ඇති කුළුණු 03 සඳහා උස සෑම මීට 05 කට රු.10,000 ක් බැගින් ගාස්තු අයකර ගැනීමටකටයුතු කර නොතිබුණි . |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.832,060 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,694,302 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනිකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | <u>රු</u>. |
|---|---|
| උසාවි දඩ | 445,664 |
| මුද්දර ගාස්තු | 583,656 |

2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පසුගිය වර්ෂයන් තුලදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.32,697 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 2.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය